## ස්වයං නියාමනය යනු කුමක්ද ?

එය පුවත්පත් විසින් ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යනු ලබන ස්වයං ක්‍රියාමාර්ගයකි. ඉන් පුවත්පත් සම්බන්ධව ජනතාවගේ සැබෑ දුක් ගැනවිලි සඳහා කඩිනම් විසඳුම් වියදමකින් සහ කරදරයකින් තොරව ලබා දීමට බලා පොරොත්තු වේ. එය නිදහස් සාධාරණ මෙන්ම ඉක්මන් ක්‍රියාවලියකි.

## එය ක්‍රියාත්මක වන්නේ කෙසේද ?

එය කර්මාන්තය විසින් ස්වේච්ඡාවෙන්ම ගාඩනගාගත් ක්‍රමයකි. ක්‍රියාත්මක වීමේදී කර්තෘවරුන් විසින් හෝ ඔවුන්ගේ අනුදැනුම මත ගොඩනගන ලද ප්‍රතිපත්ති සංග්‍රහයක් අනුව ක්‍රයාත්මක වේ. එමෙන්ම එය ස්වාධීන කොමිසමක් මගින් පාලනය වන අතර එහි වැඩි සාමාජිකත්වය සාමාන්‍ය පුරවැසියන්ගෙන් යුක්ත වන්නේ සමානත්වය සහ අපක්ෂපාතීත්වය රැකීම උදෙසාය.(එමගින් කර්තෘවරුන්ද ඔවුන්ගේ විරුද්ධවාදීන්ගේ චෝදනාවලින් ආරක්ෂා වේ )

## එය අවශ්‍ය වන්නේ ඇයි ?

වගකීම් සහගතබව වර්ධනය වන යුගයක - බොහෝවිට මාධ්‍යයෙන් එල්ලවන බලපෑම හේතුකොටගෙන - ප්‍රවෘත්ති පත්‍ර වලටද එවැනිම වගකීමක් ඇත. මෙම වගකීම අධිකරණය හරහාද සිදුවන නමුත් එය ඉතා මන්දගාමී ක්‍රියාවලියකි. එමෙන්ම එය අධික වියදම් සහිත මුදල් බලය ඇත්තන්ට ලඟාවිය හැකි ක්‍ෂෙත්‍රයකි. රජයද පුවත්පත් පාලනය කිරීමට උත්සාහ ගනී. එය පුවත්පත් මණ්ඩලය වැනි නීතිමය ආයතන මගින් ක්‍රියාත්මක වේ. කෙසේවුවද එවැනි ආයතන රාජ්‍ය බලයට ගොදුරු වීමේ ප්‍රවණතාවයක් ඇති අතර එමගින් ජනතාවට පුවත්පත් කෙරෙහි ඇති විශ්වාසයද හීන කෙරෙයි. මෙය අදහස් ප්‍රකාශකිරීමේ අයිතියට ප්‍රජාතන්ත්‍රවාදයටද අහිතකර තත්වයකි.

## ශ්‍රී ලංකාවට ඇති වාසි කවරේද ?

මෙම ක්‍රමය නිදහස්ය. දැනට ස්කැන්ඩිනේවියානු සහ වෙනත් ආධාර කණ්ඩායම් විසින් මේ සඳහා අරමුදල් සපයනු ලැබේ. එමෙන්ම එය නීතිමය ක්‍රියාමාර්ග වලට වඩා සිත් ඇදගන්නා සුලු විකල්පයකි. බොහෝ පැමිණිලි සති කිහිපයකින් පැමිණිලිකරුවන් තෘප්තිමත්වන ආකාරයෙන් සමථකරණයෙන් විසඳීම මෙහි ඇති විශේෂ ලක්‍ෂණයකි.

## පුවත්පත් දඩයකට හෝ වන්දි ගෙවීමකට යටත් වන්නේද ?

නැත. බොහෝ පැමිණිලි එකඟත්වයක් තුළ විසඳනු ලැබේ. එතුළ නිවැරදි කිරීම් සහ සමාව අයැදීම් ද ඇත. එයට ඇතැම්විට පෞද්ගලිකව කනගාටුව ප්‍රකාශ කිරීමේ ලිපිද ඇතුළත් වේ. කෙසේ වුවද අධිකරණ මාර්ගයෙන් නීතිඥවරු යොදා ලබා ගන්නා අන්දමට දඩ හෝ වන්දි ගෙවීම් නොමැත. මෙම ක්‍රමය එවැනි මන්දගාමී ළඟාවීමට අපහසු, අධික වියදම් සහිත ක්‍රමයක් නොවේ.

## පුවත්පත් මත පැනවෙන තහංචි  කවරාකාරද ?

ඔවුන් එකඟතාවකට පැමිණීම ප්‍රතික්ෂේප කරන්නේ නම් සහ එය ඔවුන්ට අහිතකර තීන්දුවකට යොමුවන්නට සිදු වන්නේ නම් කර්තෘවරුන්ට එම දැඩි තීන්දුව සම්පූර්ණයෙන්ම ප්‍රකාශයට පත් කළ යුතුය. එය ඉතා බරපතල තහංචියක් වන්නේ මෙවැන්නකදී ඔවුන්ගේ පාඨකයින්ගේ දැඩි විවේචනයට ඔවුන් ලක්වන බැවිනි. මෙහිදී ඔවුන්ගේ වාණිජමය ප්‍රතිවාදීන්ටද විවේචනයට අවස්ථාවක් ලැබේ.කෙසේ වුවද ඔවුහු යම් වරදකට වගකිව යුත්තේ නම් එකඟත්වයකට පැමිණීමට  කැමති වීමෙන් මෙම තත්වය මගහරවාගත හැකිවනු ඇත.

## මෙවන් ස්වයං නියාමන ක්‍රම ක්‍රියාත්මක වන වෙනත්  රටවල් මොනවාද ?

මෙම ක්‍රමය යහ පාලනයේ වැදගත් සංකේතයකි. ඒ මන්ද එය අනවශ්‍ය බලපෑම් වලින් පුවත්පත් ආරක්ෂා කරන හෙයිනි.  ඕස්ට්‍රේලියාවේ  සහ යුරෝපයේ මෙය බෙහෙවින් භාවිතා වේ.  කෙසේ වුවද ආසියාවේ මෙම ක්‍රමය ක්‍රියාතමක වන මුල්ම රටවලින් ශ්‍රී ලංකාවද එකකි. එමෙන්ම එය ප්‍රජාතන්ත්‍රවාදී  ක්‍රමය රැකෙන ක්‍රියාවලියක් ලෙස ආධාර ලැබීමේදී ආකර්ශනීයත්වයක් ඇතිවිය. එමනිසා ශ්‍රී ලංකාවේ යොදාගත් ක්‍රමය කලාපයේ අනෙකුත් රටවලටද ආදර්ශයක් ලෙස යොදාගත හැකිය.

## මෙම ස්වයං නියාමන ක්‍රියාවලිය නොමැති වීමෙන් ඇතිවිය හැකි තත්වය කුමක්ද ?

යම් කාරණයක් පිළිබඳ කරුණු දක්වා සිටීමට ඇති වගකීම ගිලිහී යන අතර ඒ සදහා ක්‍රියාමාර්ග ගැනීම රජය අතට පත්වීම අනර්ථකාරී තත්වයක් විය හැක. ශ්‍රී ලංකා ජනමාධ්‍ය ඇමතිවරයා පුවත්පත් මණ්ඩලය නැවත ඇති නොවන බව කියයි. කෙසේ වුවද රජයන් වෙනස් වීමේදී ලොවපුරා ලබා ඇති අත්දැකීම් අනුව මෙය කොතෙක් දුරට ස්ථිර නිගමනයක් වේද?. එක් මිත්‍රශීලී ඇමතිවරයෙක් කෙරෙහි විශ්වාසය තබා තමන් සුරක්ෂිත යයි මහජනයාට හෝ පුවත්වලට ක්‍රියාකළ නොහැක. ඔවුහු ඔවුන් විසින්ම ආරක්ෂා විය යුතුය.

## කර්තෘවරු පමණක් ප්‍රතිපත්ති සංග්‍රහය සකසනු ලබන්නේ ඇයි ?

එය ඔවුන් විසින් සකසනු ලැබූ විට බලෙන් ඔවුන් මත පැටවූවක්ය යන චෝදනාව කිරීමේ ඉඩ ප්‍රස්ථාව නොමැති වේ. ඒ නිසා එහි අවශ්‍යතාවයන් සපුරාලීමට ඔවුන්ට සිදුවේ.

## සාමාන්‍ය පුවත්පත් කලාවේදීන්ට මෙහිදී යම් හඬක් තිබේද ?

මෙය ආචාරධර්ම පද්ධතියක් ලෙස සැකසීම අන්තරායකාරීය. එය ප්‍රායෝගික පහත මට්ටම දක්වා ක්‍රියාත්මක ක්‍රමයක් විය යුතුය. කතුවරයා ස්වකීය පුවත්පතේ සිදුවන දේ සම්බන්ධව අවසාන මැදිහත්කරුය. ප්‍රායෝගික වශයෙන් ඉන් අදහස් වන්නේ ඔහුගේ කණිෂ්ඨයින්ගේ තීරණ නීති සංග්‍රහයේ ගැටීමට හෝ නොගැළපීමට හැකිවන අතරම එවැන්නක් අවසාන තීරණයද නොවේ. මෙහිදී ඉතා තදබලම සිදුවීම නම් සමහර අවස්ථාවලදී කතුවරයාට තීරණයක් ගැනීමට ඉඩ නොසලසා ක්‍රියා කිරීමයි. දෙවනුව කාර්යය මණ්ඩලයට නීති සංග්‍රහය සම්බන්ධව ප්‍රශ්ණයක් ඇත්නම් ඔවුහු එය මතු කරනු ඇත. පුවත්පතක අධික නිෂ්පාදන ක්‍රියාවලිය තුළ කර්තෘවරුන්ගේ තීරණය වැදගත් වන බව ඔවුන් තේරුම් ගත යුතුය. ඒ මන්ද, නීතියෙන් මෙන්ම ප්‍රායෝගික වශයෙන් ද ඔහු වගකීමට බැඳී සිටින හෙයිනි.